සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாணக் கல்வித் திணைக்களம
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය - 2016	10 ශ්‍රේණිය
இரண்டாம தவணைப் பரீட்சை 2016	தரம 10
Second Term Test - 2016	**Grade 10**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I	*පැය එකයි*
தகவல் தொடர்பாடல் தொழிநுட்பவியல் I	*இரண்டு மணித்தியாலம*
Informaton & Communication Technology I	***One Hour***

නම /විභාග අංකය:- ……………………………………………………………

සියලු ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. "නැණසල" මධ්‍යස්ථාන පිහිටුවීමේ අරමුණ වන්නේ,
   1. ග්‍රාමීය ප්‍රදේශ ICT දැනුමෙන් සවිබල ගැන්වීම.
   2. තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස යොදා ගැනීම.
   3. ICT අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස යොදාගැනීම.
   4. ඉහත කරුණු සියල්ලම

02. පහත සඳහන් දෑ අතුරින් දත්තයක් නොවන්නේ,
   1. සිසුවකුගේ බර
   2. සේවකයකුගේ මූලික වැටුප
   3. ආයතනයක ශුද්ධ ලාභය
   4. සිසුවෙකුගේ ඇතුළත් වීමේ අංකය

03. තොරතුරක ගුණාංගයක් නිරූපණය නොකරන කරුණක් වන්නේ,
   1. අදාළ බව
   2. නිරවද්‍යබව
   3. කාලීනබව
   4. පිරිවැය වැඩි වීම

04. දුරස්ථ සෞඛ්‍ය රැකවරණය (Telemedicine) මගින් ඇතිවන වාසියක් නොවන්නේ,
   1. දුරස්ථ පුහුණුව
   2. දුරස්ථ ශල්‍යකර්ම
   3. උපදෙස් ලබා ගැනීමට නොහැකි වීම
   4. නිවසේ සිට අධීක්ෂණය

05. චාල්ස් බැබේජ් විසින් නිර්මාණය කළ ඇනලිටිකල් යන්ත්‍රයේ තිබූ සංකල්පය වන්නේ,
   1. ආදානය හා ප්‍රතිදානය
   2. සකස් කිරීම.
   3. ආචයනය
   4. ඉහත සියල්ලම

06. ලොව ප්‍රථම පරිගණක වැඩසටහන් ශිල්පිනිය වන්නේ,
   1. Howord Aiken
   2. Ada Augusta
   3. Charles Babage
   4. Joseph Jacquard

07. දත්ත ආචයනය සඳහා Keyboard හා Mouse භාවිතා කිරීම ආරම්භ කළ පරම්පරාව වන්නේ,
   1. පළමු පරම්පරාව
   2. දෙවන පරම්පරාව
   3. තුන්වන පරම්පරාව
   4. හතරවන පරම්පරාව

08. පස්වන පරම්පරාවේ පරිගණක වල ලක්ෂණයක් නොවන්නේ,
   1. එහා මෙහා ගෙන යා හැකිය
   2. අඩු වියදම් සහිතය
   3. ප්‍රමාණයෙන් විශාලය
   4. කාර්යක්ෂමතාවය ඉතා ඉහළය

ictnotes.org

09. පරිගණකය සතු විශේෂ ලක්ෂණයක් නොවන්නේ,

1. වේගය
2. අකාර්යක්ෂමතාවය
3. නිරවද්‍යබව
4. බහුකාර්ය බව

10. දැක්වීමේ උපාංගයක් (Pointing Device) නොවන්නේ,

1. මෙහෙයුම් යටිය (Joy Stick)
2. මූසිකය (Mouse)
3. Track ball
4. සුපරික්සකය (Scanner)

11. තාක්ෂණය අනුව පරිගණක වර්ග කරනුයේ,

1. සුපිරි පරිගණක, මහා පරිගණක, මධ්‍ය පරිගණක
2. මහා පරිගණක, ප්‍රතිසම පරිගණක, මධ්‍ය පරිගණක
3. ප්‍රතිසම පරිගණක, සංඛ්‍යාංක පරිගණක, මිශ්‍ර පරිගණක
4. ප්‍රතිසම පරිගණක, මහා පරිගණක, මිශ්‍ර පරිගණක

12. විභාග බහුවරණ උත්තර පත්‍ර ආදිය ලකුණු කිරීම සඳහා බහුලව යොදා ගන්නා සුපරීක්ෂකය වන්නේ,

1. OMR 2. OCR 3. MICR 4. ඉහත එකක්වත් නොවේ.

13. එකවර කිහිප දෙනෙකුට නැරඹිය හැකි ලෙස පුළුල් තිරයකට තොරතුරු ප්‍රතිදානය කර ගැනීමට භාවිතා කරන උපාංගය වන්නේ,

1. LCD 2. LED 3. CRT 4. PROJECTOR

14. මධ්‍ය සැකසුම් ඒකකයේ කොටස් වන --------------- මගින් පරිගණක පද්ධතියක් සියලු උපක්‍රම භාවිතා කරයි. හිස්තැනට සුදුසු වන්නේ,

1. ALU 2. CU 3. Memory Register 4. ඉහත සියල්ලම

15. ද්විතීයික ආචයනය වර්ග කල හැකි ආකාර වන්නේ,

1. චුම්භක මාධ්‍ය උපක්‍රම
2. ප්‍රකාශ මාධ්‍ය උපක්‍රම
3. ඝන තත්වයේ උපක්‍රම
4. ඉහත සියල්ලම

16. මුද්‍රණ යන්ත්‍රය පරිගණකයට සම්බන්ධ කිරීමට භාවිතා කරන කෙවෙනිය වන්නේ,

1. ps/2 2. HDMI 3. Serial port 4. parallel port

17. ස්විචය හා නාභිය අතර වෙනස්කමක් වන්නේ,

1. නාභිය විසින් අනවශ්‍ය තදබදයක් ඇතිකරයි.
2. ස්විචය මගින් වේගයෙන් තොරතුරු හුවමාරු කරයි.
3. නාභිය විසින් අර්ධ ද්විපථ ක්‍රමය යොදා ගනී
4. ඉහත සියල්ලම

18. ප්‍රධාන වයරක් හරහා සියලු සම්බන්ධතා ඇති කරමින් ජාලගත කිරීම හඳුන්වන නම වන්නේ,

1. තරු ආකාර
2. මුදු ආකාර
3. රුක් ආකාර
4. බස් ආකාර

19. ජාලකරණයේ වාසියක් නොවන්නේ,

1. අඩු ඉඩක දත්ත ගබඩා කිරීම.
2. විද්‍යුත් තැපෑල
3. පුහුණු අවශ්‍යතා
4. සම්පත් පොදුවේ භාවිතා කිරීම.

20. $A1C_{16}$ සංඛ්‍යාවට අනුරූප ද්වීමය සංඛ්‍යාව වනුයේ,

1. 101000011100_2 2. 101010001100_2 3. 111100011101_2 4. 10100010110_2

21. පරිගණකයක භෞතිකාංග විස්තර කිරීමට බහුලව භාවිතා වන පොදු පදය වන්නේ ,

1. මෘදුකාංග (Software)
2. දෘඩාංග (Hardware)
3. ස්ථිරාංග (Firmware)
4. ජීවාංග (live ware)

ictnotes.org

22. කණ්ඩායම් දෙකක් අතර තොරතුරු හුවමාරුව මේනමින් හඳුන්වයි .

1. දත්ත හුවමාරුව 2. උපදෙස් හුවමාරුව 3. සන්නිවේදනය 4. උපදේශනය

23. ප්‍රමාණය අනුව පරිගණක වර්ගීකරණය වී ඇති නිවැරදි ආකාරය තෝරන්න.

1. සුපිරි පරිගණකය (Super Computer), මහා පරිගණකය (Mainframe Computer), මධ්‍ය පරිගණකය (Mini Computer), ක්ෂුද්‍ර පරිගණකය (Micro Computer).
2. සුපිරි පරිගණකය , මධ්‍ය පරිගණකය, මහා පරිගණකය, ක්ෂුද්‍ර පරිගණකය.
3. ක්ෂුද්‍ර පරිගණකය, සුපිරි පරිගණකය, මහා පරිගණකය, මධ්‍ය පරිගණකය
4. ක්ෂුද්‍ර පරිගණකය, මහා පරිගණකය, මධ්‍ය පරිගණකය, සුපිරි පරිගණකය

24. පරිගණකයෙහි තාවකාලිකව මකන ලද ගොනු තැන්පත් වන ස්ථානයයි .

1. My computer 2. My Document 3. Recycle bin 4. Control panel

25. ඉහළ බිටු පරාසයකින් (high bit rates) යුතු දත්ත සම්ප්‍රේෂණ මාධ්‍ය වනුයේ,

1. සමාවෘත ඇඹරුම් කම්බි යුගල (Shielded Twisted pair)
2. අනාවරිත ඇඹරුම් කම්බි යුගල (Unshielded Twisted pair)
3. සමාක්ෂක යොත් (Coaxial Cable)
4. ප්‍රකාශ තන්තු (Optical Fiber)

26. සන්නිවේදනයේදී සර්වරය (server) හැරුණු විට පරිගණක ජාලයට සම්බන්ධ වන්නකි.

1. වැඩ හල (Workstation) 2. ෆයිල් සර්වරය File Sever
3. ජාලකරණ අතුරු මුහුණත් කාඩ්පත (Network Interface Card) 4. මොඩමය (Modem)

27. උපයෝගිතා මෘදුකාංග (Utility software) යනු

1. යෙදුම් මෘදුකාංගයකි (An application Software) 2. පද්ධති (System) මෘදුකාංගයකි
3. භාෂාවකි. 4. දෘඩාංග (Hardware)

28. අෂ්ටක 536 ට සමාන අගය :

1. 101011110_2 2. 101111110_2 3. 101101101_2 4. 110110110_2

29. 1010_2 සහ 1101_2 හි ඓක්‍යය සමාන වනුයේ

1. 1101_2 2. 10110_2 3. 10111_2 4. 110110_2

30. අෂ්ටක සංඛ්‍යා පද්ධතියෙහි පාදක අගය

1. 2 කි. 2. 8 කි. 3. 10 කි. 4. 16 කි.

31. 23 දශමකය දක්වන BCD කේතය දක්වන්න.

1. 10110011 2. 0010 0011 3. 101 011 4. 0100 1011

32. පරිගණකයේ " **මොළය** " ලෙස විරුදාවලි ලබා ඇත්තේ ,

1. මධ්‍ය සැකසුම් ඒකකය (CPU)
2. සසම්භාවී ප්‍රවේශ මතකය (RAM)
3. පඨන මාත්‍ර මතකය (ROM)
4. පද්ධති ඒකකය (System Unit)

33. BIOS වල ප්‍රධාන කාර්යය වනුයේ

A. ප්‍රවේශනය කිරීම (Bootstrap loader)

ictnotes.org

B. විදුලි බලය ලැබීම පිළිබඳ ඉබේ පරීක්ෂාව (POST)

C. ක්‍රියාකාරිත්ව ඇරඹුම (Start-up)

1. A පමණි. 2. B පමණි. 3. A සහ B පමණි. 4. A, B සහ C සියල්ලම

34. දෙවන පරම්පරාවේ පරිගණක වල භාවිත වූ තාක්ෂණය

1. ට්‍රාන්සිස්ටර -Transistors 2. රික්තක නල - Vacuum Tubes

3. මහා පරිමාන අනුකලිත පරිපථ (Very Large Scale IntegratedCircuits)

4. අනුකලිත පරිපථ - IntegratedCircuits

35. පළමු ආංකිත පරිගණකය

1 . ඉනිඇක් - ENIAC 2. මාර්ක් 1 - Mark 1

3. යුනිවැක් -UNIVAC 4. මයික්‍රෝ - MICRO

36. පරිගණක පද්ධතියක ප්‍රධාන ඒකක වනුයේ

1. යතුරු පුවරුව (Key board), සන්දර්ශකය (Monitor), මුද්‍රකය (Printer), CPU

2. ආදාන උපක්‍රම (Input devices), සකසනය (Process), ප්‍රතිදාන උපක්‍රම (Output devices), ආචයන උපාංග (Storage devices)

3. සසම්භාවී ප්‍රවේශ මතකය (RAM), පඨන මාත්‍ර මතකය (ROM), වාරක (Cache) මතකය,
දෘඪ තැටිය (Hard Disk)

4. ප්‍රාථමික මතකය (Primary memory), ද්විතියික මතකය (Secondary memory), මතක රෙජිස්තර (Memory registers), මව් පුවරුව (Mother board)

37. දෘඪ තැටිය සෝදිසි/අවේක්ෂණය (check) කිරීම සඳහා යොදා ගන්නා මෙවලම

1. Scandisk වේ. 2. Defragmentation වේ.

3. Disk cleanup වේ. 4. Disk format වේ.

38. මොඩම (MODEM)යන වචනය සෑදී ඇති පිළිතුර වනුයේ

1. MOdulator - DEModulator 2. MODern - EMbedded

3. MOD - DEM 4. MOst Developed Machine

39. පරිගණකයට උපකරණයක් සම්බන්ධ කලවිට පරිගණකය තුලින්ම විදුලි බලය ලබාගන්නේ....... කෙවෙනි භාවිතයෙනි

1. Serial Port 2. Parallel Port

3. USB Port 4. PS/2 Port

40. ASCII යන්නෙන් අදහස් වන්නේ

1. American Standard Code for Information Interchange

2. American Standard Code for Information Interconnect

3. American Standard Code for Information Interpret

4. American Standard Code for Information Interflow

ictnotes.org

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாணக் கல்வித் திணைக்களம
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය - 2016	**10 ශ්‍රේණිය**
இரண்டாம தவணைப் பரீட்சை 2016	**தரம 10**
Second Term Test - 2016	**Grade 10**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය II	***පැය දෙකයි***
தகவல் தொடர்பாடல் தொழிநுட்பவியல் II	***இரண்டு மணித்தியாலம***
Informaton & Communication Technology II	***Two Hours***

ictnotes.org

නම /විභාග අංකය:- ……………………………………………………

- පළමු ප්‍රශ්නය ඇතුලු ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නය සඳහා ලකුණු 20 ක්ද අනෙක් ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින්ද හිමිවේ.

01. i. දත්ත ඇතුලු කිරීම සඳහා භාවිතා කරනු ලබන දැක්වීමේ උපක්‍රම (pointing devices) 2 ක් හා සුපරික්සන (scanners) 2 ක් දක්වන්න.

ii. මානව සම්පත් කළමණාකරණයේදී සේවක පැමිණීම සටහන් කිරීම සඳහා භාවිතා කරනු ලබන උපක්‍රම දෙකක් සඳහන් කරන්න.

iii. ද්විතියික ගබඩාකරණයේදී භාවිතා වන ප්‍රකාශ මාධ්‍ය උපක්‍රම 3 ක් දක්වන්න.

iv. පරිගණක ජාලකරණයේදී යොදා ගනු ලබන මොඩම් යන්ත්‍රයෙහි කාර්යභාරය කුමක්ද?

v. චෙක්පතක ඇති නිරවද්‍යතාවය පරික්ෂා කිරීම සඳහා භාවිතා කරනු ලබන ආදාන උපක්‍රමය ලියන්න.

vi. 674_8 යන අෂ්ටක සංඛ්‍යාව දශමය සංඛ්‍යාවක් බවට පරිවර්තනය කරන්න.(පියවර දැක්වීම අවශ්‍ය වේ.)

vii. මතක කළමණාකරණය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

viii.නොමිලයේ සපයා ගත හැකි වදන් සැකසුම් මෘදුකාංග දෙකක් සඳහා උදාහරණ ලියන්න.

ix. ctrl+x හා ctrl+v යන කෙටි මං භාවිතා වනුයේ කුමන කාර්යයන් ඉටුකර ගැනීම සඳහා ද?

x. ASCII හා EBCDIC යන කේත ක්‍රම දෙක අතර වෙනස පහදන්න.

02. i. මෙහෙයුම් පද්ධතියක් යනුවෙන් කුමක් අදහස් වේද?

ii. බහු පරිශීලක මෙහෙයුම් පද්ධති හා බහු කාර්ය මෙහෙයුම් පද්ධති අතර වෙනස පැහැදිලි කරන්න.

iii. විධාන පේළි අතුරු මුහුණත් හා චිත්‍රක පරිශීලක අතුරු මුහුණත් සංසන්දනය කරන්න.

iv. මෙහෙයුම් පද්ධතියක් තුළ පවතින උපයෝගිතා වැඩ සටහන් කිහිපයකි.එහිදී පංගු බෙදීම (partitioning) ද එක් වැඩ සටහනකි. මෙසේ පංගු බෙදීමක් අවශ්‍ය වන්නේ ඇයි දැයි උදාහරණ දෙකක් ඇසුරින් පහදන්න.

03. i. පහත දැක්වෙන අටේ පාදයේ සංඛ්‍යා දෙකේ පාදයට හරවන්න

i. $43_{අට}$ ii. $437_{අට}$

ii. පහත දැක්වෙන දහයේ පාදයේ සංඛ්‍යා දහසයේ පාදයට හරවන්න

i. 49 ii. 230

iii. පහත සඳහන් පරිපථය සඳහා සමීකරණය ලියන්න



iv. පහත සමීකරණයට අදාල තාර්කික පරිපථය ඇඳ දක්වන්න.

i $X= (A.B).\overline{(A+B)}$

04 ' පහත දී ඇති රූපය ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



i. A මගින් දැක්වෙන පිටු සීමාවට (Margin) ඉහළින් දැක්වෙන කොටස නම් කරන්න.

ii. B මගින් දැක්වෙන පෙළ සඳහා යොදා ගෙන ඇති එක එල්ල කිරීම (alignment) ආකාරය කුමක්ද?

iii. C මගින් දැක්වෙන පෙළ සඳහා යොදා ගෙන ඇති හැඩසවි (formatting) පැහැදිලි කරන්න.

iv. මෙම ලිපිය කිහිප දෙනෙකුට ඔවුන්ගේ ලිපිනයන් වෙතට යැවීමට අවශ්‍යව ඇත. ඒ සඳහා වදන් සැකසුම් මෘදුකාංග වල ඇති පහසුකම කුමක්ද?

v. ඉහත රූපයේ දක්නට නොමැති ලේඛන, සකස් කිරීම සඳහා වදන් සැකසුම් මෘදුකාංග වල ඇති පහසුකම් දෙකක් සඳහන් කරන්න.

ictnotes.org

05. i. පහත දැක්වෙන සටහන පුරවන්න.

<table>
<tr><td colspan="2" align="center">User (භාවිතා කරන්නා)</td></tr>
<tr><td colspan="2" align="center">C</td></tr>
<tr><td align="center">A</td><td align="center">B</td></tr>
<tr><td colspan="2" align="center">Hardware</td></tr>
</table>

ii. ගොනු කළමණාකරණය සඳහා මෙහෙයුම් පද්ධතියක් ලබා දෙන සේවා 02 සඳහන් කරන්න.

iii. Disk partitioning (පංගු බෙදීම) yd Disk formatting (ආකෘතිකරණය) යන්න කෙටියෙන් පහදන්න.

iv. වදන් සැකසුම්, ගොනුවක දිගුව (file extension) කුමක්ද?

06. i. ඉ - රාජ්‍ය යනුවෙන් කුමක් අදහස් වේදැයි දක්වා එය සේවා සපයන ආකාර හතර දක්වන්න.

ii. දුරස්ථ අධ්‍යාපනය යනුවෙන් අදහස් වනුයේ කුමක්ද?

iii. ඉ - බැංකු පද්ධති භාවිතයෙන් ව්‍යාපාරිකයන්ට අත්විය හැකි වාසි දෙකක් ලියන්න.

iv. මාර්ගගත සාප්පු සවාරි තුලින් ව්‍යාපාරිකයන්ට මෙන්ම පාරිභෝගිකයන්ටද වාසි අත්කර ගත හැකිවේ. ඔවුන්ට ලබා ගත හැකි වාසි 4 ක් දක්වන්න.

.

ictnotes.org

10 ශ්‍රේණිය

පිළිතුරු

1	1	11	3	21	2	31	2
2	3	12	1	22	3	32	1
3	4	13	4	23	1	33	3
4	3	14	4	24	3	34	3
5	4	15	4	25	3	35	1
6	2	16	4	26	4	36	4
7	3	17	4	27	1	37	1
8	3	18	4	28	1	38	1
9	2	19	3	29	333	39	3
10	4	20	1	30	2	40	1

ictnotes.org

පිළිතුරු තෙවන කට්ටලය

01. i. දැක්වීමේ උපක්‍රම - මූසිකය , ස්පර්ශ සංවේදී තිරය , මෙහෙයුම් යටිය , ආලෝක පෑන

සුපිරික්සන - පැතලිතල සුපිරික්සනය , තීරුකේත කියවනය , චුම්බක තීන්ත අනු ලක්ෂණය , ප්‍රකාශ අක්ෂර සංජානනය , ප්‍රකාශ සළකුණු සංජානනය , ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය

ii. ඇඟිලි සළකුණු සුපිරික්සනය , කාඩ්පත් කියවනය

iii. සංඛ්‍යාංක බහුවිධ තැටි , සංයුක්ත තැටි , බ්ලූ රේ තැටි

iv. ඩිජිටල් ආකාරයේ දත්ත හා තොරතුරු ඇනලොග් ආකාරයටත් ඇනලොග් ආකාරයේ දත්ත හා තොරතුරු ඩිජිටල් ආකාරයටත් පරිවර්තනය කිරීම.

v. චුම්බක තීන්ත අනුලක්ෂණය (MICR)

vi. 6748 - 6 7 4

64 8 1

384 + 56 + 4

444

vii. ක්‍රියාවලි සඳහා මතකය වෙනුවෙන් ඇතිවිය හැකි ගැටුම් වලකාලමින් ක්‍රියාවලි සඳහා අවශ්‍ය කරන මතකය වෙන් කර දීමත් එම ක්‍රියාවලි අවසානයේදී මතකය නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු කිරීමත්ය.

viii. Open office writer , Libro Office writer

ix. කැපීම ඇලවීම

x. ASCII- American Stranded Coded for Information Interchange

EBCDIC – Extended Binary Coded Decimal interchange code

02 ' i. පරිගණකයේ ස්ථාපිත අනෙකුත් මෘදුකාංග හා දෘඩාංග කළමණාකරණය කරමින් පරිශීලකයාට පරිගණකය භාවිතා කිරීමට අවස්ථාව ලබාදීමයි.

ii. එක් වරකට එක් පරිශීලකයෙකු සම්බන්ධයෙන් සේවා සපයන මෙහෙයුම් පද්ධති ඒක පරිශීලක වන අතර බොහෝ පරිශීලකයන්ට එකවර පරිගණක යන්ත්‍රයක් වෙත ප්‍රවේශ වීමට පහසුකම් සපයන මෙහෙයුම් පද්ධති බහු පරිශීලක වේ.

iii.

GUI	CLI
පරිශීලකයාට ප්‍රියමනාප වේ.	පරිශීලකයාට අපහසු වේ.
මූසිකය හා යතුරු පුවරුව ඇතුළත් කර දත්ත ඇතුලු කරයි.	අණකිරීම් හා උපදෙස් මතකයෙන් ඇතුලු කළ යුතු වේ.
WIMP ලෙස සංරචක 4 කි.	අණකිරීම් හා උපදෙස් ප්‍රේරකය මත ඇතුලු කළ යුතු වේ.

ictnotes.org

iv. පරිගණකයේ තැන්පත් කරනු ලබන දේවල් වෙන වෙනම තැන්පත් කර ගැනීමට

පරිගණකයේ මෙහෙයුම් පද්ධති එකකට වඩා ඇතුල් කිරීමට

මෙහෙයුම් පද්ධතියේ වූ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට

03. **පිළිතුරු නැත.**

04.

I.

II. Left Align

III. උදාල වදන්පෙළ Select කිරීම, Change case බොත්තම තද කර UPPERCASE යන්න තේරීම, Bold බොත්තම හා Underline බොත්තම තද කිරීම.

IV. Office button එක තද කර ලැබෙන මෙනුවෙන් Print යන්න තෝරන්න, Name යටතට අදාල මුද්‍රණ යන්ත්‍රය තෝරා Page Range සඳහා ALL ද , Page size සඳහා A4 ලබා දී OK කරන්න.

05. **පිළිතුරු නැත.**

06.

i. රජයක් තොරතුරු තාක්ෂණය යොදා ගනිමින් රාජ්‍ය පාලන කටයුතු සිදු කිරීමයි. රජයෙන් පුරවැසියන්ට ,

රජයෙන් වෙනත් රාජ්‍ය වලට , රජයෙන් ව්‍යාපාර වලට , රජයෙන් සේවකයන්ට

ii. අන්තර්ජාලය භාවිතා කර ඕනෑම රටක සිට ඕනෑම ආකාරයේ අධ්‍යාපන ආයතනයක් හා සම්බන්ධ වීම

තුළින් ඉතා අඩු වියදමකින් උසස් පාඨමාලාවක් හැදෑරීමයි.

iii. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මඟින් ඕනෑම වේලාවක ඕනෑම ස්ථානයකදී මුදල් ලබා ගැනීමේ හැකියාව , අන්තර්ජාලය හා සම්බන්ධ වී ඇති බැවින් ලෝකයේ ඕනෑම රටක සිට ගනුදෙනු කිරීමේ හැකියාව , පහසු ස්ථානයක සිට ජංගම දුරකථනය හා ජංගම පරිගණකය භාවිතා කර බිල්පත් ගෙවීම , බැංකු ගිණුම් අතර මුදල් හුවමාරුව , ගිණුම් පරීක්ෂා කිරීමේ හැකියාව

iv. පැය 24 හිම විවෘතව තැබීම , හර කාඩ් මගින් මුදල් ගෙවීමට හැකිවීම , පහසු ස්ථානයක සිට භාණ්ඩ නිරීක්ෂණය කොට ඇණවුම් කිරීමේ හැකියාව , අන්තර්ජාලයේ ඇති ඕනෑම රටක වෙළඳ ආයතනයක් තෝරා ගැනීමේ හැකියාව

ictnotes.org